# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

## 7 ශ්‍රේණිය

**සිංහල භාෂාව හා සාහිත්‍යය    කාලය : පැය 02**

නම:...............................................................................................................................................................

**1 කොටස**

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු ලියන්න.

* ඉරි ඇඳි පදයට වඩාත් ගැළපෙන අර්ථය සහිත යෙදුම තෝරන්න.

01)ඔහුගේ <u>පරිශ්‍රමයෙන්</u> ග්‍රාමීය පාසල් ද සංවර්ධනය විය.

1.වෙහෙසවීමෙන්    2. ධන පරිත්‍යාගයෙන්    3. උනන්දුවෙන්    4. කැපවීමෙන්

02) වැලිවිට සරණංකර හිමි ශාසනික <u>පුනර්ජීවනයේ</u> පුරෝගාමියා වන්නේ ය.

1.නැවත පණ ගැන්වීමේ    2.නැවත අඩාලවීමේ    3. මුල්වීමට හේතුවීමේ    4. ප්‍රබෝධය

03) නොයෙක් <u>දේශයන්හි සැරිසැරූ</u> ඔහු ලෝකය පිළිබඳ තතු දැන ගත්තේ ය.

1. දේශගවේෂි    2. දේශාටක    3. සංචාරක    4. විදේශික

04) පුරාතන රජදරුවෝ <u>ආචාර්ය භාගය</u> රැගෙන තක්සලා නුවරට ගොස් ශිල්ප උගත්තේ ය.

1. මසුරන්    2. ගුරුපඬුරු    3. සුබවේලාවන්    4. පිළිසඟළක්

05) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

1. පුස්ථකාලය, සීඝ්‍රගාමී,ප්‍රස්තාර, කොට්ඨාසය    2. ජොෂ්ඨ, ලේකම්, කාර්යාලය, ප්‍රශ්නය
3. ලේඛනය, වර්ධනය, නිසාචර, කන්නාඩිය    4 . වර්ධනය, පරිගණකය, ශීඝ්‍රගාමී, කොට්ඨාස

06) සඤ්ඤක අක්ෂරයක් යෙදී ඇති  පදය තෝරන්න.
1. වලාකුළු    2. අඹර    3. අවධානය    4. සෟණ

07) “සාගරය” යන පදයට සමාන අර්ථයක් නොදෙන පදය තෝරන්න
1. සිඳු    2. සයුර    3. මුහුද    4. නදිය

08) “ප්‍රවීණ” යන පදයට විරුද්ධාර්ථ පදයක් වන්නේ,
1. සහජ    2.දක්ෂ    3. නිපුණ    4. ආධුනික

09) “ඔහු” යන පදය අයත් වන්නේ
1. උත්තම පුරුෂ ඒකවචන   2. ප්‍රථම පුරුෂ ඒකවචන   3. මධ්‍යම පුරුෂ ඒකවචන   4. ප්‍රථම පුරුෂ බහුවචන

10) “අනපේක්ෂිත ගැටලුවකට මුහුණදීම” යන තේරුම දෙන ඉඟි වැකිය වන්නේ,
1. බළලා මල්ලෙන් එළියට පැන්නා වාගේ    2. තරු පෙනුණා
3. කරල පැහුණා    4 ඉඟුරු දී මිරිස් ගත්තා

11) සිංහල අක්ෂර මාලාවේ මහාප්‍රාණ අක්ෂර සංඛ්‍යාව වන්නේ ,
1 විස්සයි 2. දහඅටයි 3. දහයයි 4. දහනවයයි

12) පිළිවෙළින් මුල් අකුරේ ඉස්පිල්ල, පාපිල්ල, ඇදය, නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.
1.වියත, පැනය, රුවල 2 නිතර, රුවන්, සැකය, 3 පින්න, ඇබය, පුවරු 4 නිල්ල, කුසුම, පුළුන්

13) ප්‍රාදේශීය භාෂාවේ " රසබෝය" ලෙස හඳුන්වන්නේ ,
1. තේ කහට 2. ඇඹුල 3. හකුරු 4. ඉදල

14) පහත සඳහන් පදවල අනුක්ත පද පමණක් ඇති පිළිතුර තෝරන්න.
1අපි, සතුන්, ළමයි, ගැහැනියක 2. මා, තරුණයන්, දරුවකු, ගැහැනියක
3 අප, සමනල්ලු, දරුවකු, ගැහැනියක 4. නුඹ, දරුවා, දරුවෝ, ගැහැනියක

15) මල්ලී සරුංගලය <u>සාදා</u> උඩ <u>යවමින්</u> සතුටු වෙයි. මෙහි ඉරිඇඳි ක්‍රියාපද පිළිවෙළින් ,
1. පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා 2. විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
3. මිශ්‍ර ක්‍රියා , විධි ක්‍රියා 4. පූර්ව ක්‍රියා , විධි ක්‍රියා

16) චන්ද්‍රරත්න මානවසිංහ මහතාගේ කවි නිර්මාණ නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ ,
1. වැස්ස, සිනා කුමාරි, වෙසක් මිහිර 2. වෙසක් මිහිර, ඇත්ගාලේ දරු පෙම, මගේ රට
3. රාත්‍රිය, සේපාලිකා, මගේ රට 4. මගේ රට , වැස්ස , කුමාරි

17) "<u>සිරිපා ලකුණ</u>" ගැන සටහන් තැබූ විදේශිකයෝ බොහෝ ය. ඉරි ඇඳි කොටසේ ඇති විරාම ලක්ෂණය වන්නේ ,
1. යුගල උඩුකොමාවයි. 2. තනිඋඩු කොමාවයි 3. කොමාවයි. 4. පෙරළි කොමාවයි.

- පහත වාක්‍යවල හිස්තැනට සුදුසු පිළිතුර තෝරන්න.

18) ඔහු වැවට පනිමින් ජල ක්‍රීඩා ................
1. කරයි 2. කෙරුවෙහු 3. කරන ලදී 4.කළහ.

19) අපි හේනේ වැඩ කරන ...........................දුටුවෙමු.
1. ගොවියෙක් 2. ගොවියන් 3. ගොවියෝ 4 ගොවීහු

20) ........................................තම මව සමග පාසලට ගියා ය.
1. දැරියක 2. දැරියෝ 3. දැරියක් 4. දැරියන්

(ලකුණු 20 ×2=40)

## 11 කොටස

උපදෙස් : මෙම කොටසේ 01 සහ 02 ප්‍රශ්න අනිවාර්ය වේ. 03, 04, 05, 06 07 ප්‍රශ්නවලින් 03ක් තෝරාගෙන ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.

01) ඔබ විසින් පන්ති කාමරයේ දී සකස් කරන ලද බිත්ති පුවත්පත ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I. බිත්ති පුවත්පත සඳහා ඔබට ලැබුණු මාතෘකාව කුමක්ද ? (ලකුණු 02)
II. බිත්ති පුවත්පත සකස් කිරීමේ දී ගුරුතුමියගෙන් ලැබුණු උපදෙස් දෙකක් ලියන්න. (ලකුණු 02)
III. බිත්ති පුවත්පත සකස් කිරීමේ දී ඔබට මතු වූ ගැටලු දෙකක් ලියන්න. (ලකුණු 02)
IV. බිත්ති පුවත්පත සකස් කිරීම සඳහා කරුණු සොයාගත් මූලාශ්‍ර දෙකක් නම් කරන්න. (ලකුණු 04)
V. බිත්ති පුවත්පතට ඔබ ඇතුළත් කළ අංගය කුමක්ද ? (ලකුණු 02)
VI. බිත්ති පුවත්පත සකස් කිරීමෙන් ඔබ ලැබූ ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 04) (ලකුණු 16)

02) පහත මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 150කට නොඅඩු රචනයක් ලියන්න.

I. ගැමිදිවියයි ජන කවියයි.
II. අධ්‍යාපනය සාර්ථකත්වයට මාවතකි.
III. සුන්දර හෝර්ටන් තැන්න රැක ගනිමු.
IV. වැසිදිනයක අතරමං වූ මා
V. පොදු දේපල සුරකිමු . (ලකුණු 14)

03) ඔබ පාසලේ වාර්ෂික අධ්‍යාපන චාරිකාවේ දී 7 ශ්‍රේණියේ සිසු සිසුවියන් ග්‍රහලෝකාගාරය නැරඹීමට යාමට අදහස් කර ඇත. ඒ සඳහා අවසර ගැනීමට ග්‍රහලෝකාගාරයේ අධ්‍යක්ෂතුමාට ලියන ලිපිය සකස් කරන්න. පාසල් චාරිකා සංගමයේ ලේකම් ඔබ යැයි සිතන්න.

( ලකුණු 10)

04) පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

I. නූතන සිංහල අක්ෂර මාලාවේ අක්ෂර ගණන කීය ද ?
II. "ආතාගේ රැවුල කිරි වගෙයි" මෙහි උපමාව සහ උපමේය වෙන් කර දක්වන්න.
III. මිශ්‍ර ක්‍රියා පදයක් යොදමින් වාක්‍යයක් නිර්මාණය කරන්න.
IV. එඩ්මන්ඩ් පිරිස් රදගුරුතුමාගේ උපන් දිනය කවදා ද ?
V. "සිල්වත් තැන" නමින් හඳුන්වන්නේ කවුද ?
VI. "ගත වතු සුදු - වී පිරිසිදු" යන පද්‍ය කාගේ නිර්මාණයක් ද ?
VII. සමන්තකූට පර්වතය කුමන දෙවියන්ගේ වාස භූමියක් ද ?
VIII. ජාතක පොත ලියැවුණු යුගය නම් කරන්න.
IX. "සිනා කුමාරි" පද්‍ය කාගේ නිර්මාණයක් ද ?
X. "ගොවි බිරියගේ නුවණ" ජන කතාව කිනම් ජාතියක ජනකතාවක් ද ?

(ලකුණු 10)

05) පහත දී ඇති ගීතය ඇසුරින් පිළිතුරු සපයන්න.

සුදෝ සුදුවැ වලාකුළෙනි
ඇයි මේ සිල් ගත්තා වැනි
මඟුලට කළු නොනිසි බැවිනි
එය හැර අපි යමු  මෙවෙසනි
ඉරු දෙව් බබළවයි පහන
වලා ඉහළ කෙරෙයි වියන
දිසාවෙනැ යි මේ හිරු එන්නේ පායා
හැරි සිටි සුරියකත් ගසේ මල්
රුසු යි දිළෙන්නේ ලණු මෙන් ඇදිලා
මඟුල් ගෙයක් දෝ ලොව මේ වෙලාවේ

I. මෙම කවි පෙළෙන් දවසේ කවර කාලයක් පිළිබඳව හැඟවේ ද ?
II. කවියා වලාකුළු උපමා කරන්නේ කුමකටද ?
III. "හිරු දෙව් බබළවයි පහන"යන්නෙහි අරුත කුමක්ද ?
IV. ලොව මඟුල් ගෙයක් සේ අලංකාර වීමට හේතු දෙකක් ලියන්න
V. කවියේ සඳහන් පරිදි ලණුවලට කවියා උපමා කර දක්වන්නේ මොනවාද ? (ලකුණු 10)

06) " ඉදිරියේ දී පාටව කෙරෙමි"

ඉහත ප්‍රකාශය කියන ලද්දේ කවුරුන් විසින් කාහටද ?

I. මෙම පාඨය ඇතුළත් පාඩම කුමක්ද ?
II. එම පාඩම උපුටාගත් මුල් ග්‍රන්ථය කුමක්ද ?
III. එය ලියවුණු යුගය කුමක්ද ?
IV. එය රචනා කරන ලද්දේ කාගේ ඉල්ලීමකටද ? (ලකුණු 10)

07) පහත සඳහන් දෙබස් කවුරුන් විසින් කාහට කියන ලද්දක් ද ?

| ප්‍රකාශය | කවුරුන් විසින් | කාහට ද ? |
|---|---|---|
| I." ආයුබෝවන් යහළුව, මේ උදැසන කෙසේ ද ඔබගේ සුවදුක් " | | |
| II. "හා..හා යමු දරුවනේ,සේදැරි කරමු " | | |
| III. "ඇයි ආචාරිනි, තොපි මරණ නළලේ තබා අවුද? " | | |
| IV. "ඇයි ඉතින් ගැලවෙන විදියක් ඔබ ම කල්පනා නොකරන්නේ ? " | | |
| V. " ඇයි මැණියනි, මම කුමන අනාථාවක් කෙළෙම් ද " | | |

(ලකුණු 10)

***